


දේශ පාලනය ...වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම එය දේශය පාලනය මය විය යුතුය ,එහි විහන්ගයක් නොමැත එබැවින් එය හුදෙක් දේශය පාලනයම .නමුත් අපේ පාර්ලිමේන්තුව නියෝජනය කරන එකදු පුද්ගලයෙකුට හෝ මේ වචන පරිස-මාප්තිය තෙරේනම් සත්‍යයෙන්ම එය ආශ්චර්යකි .ප්‍රවේණිය සහ ප්‍රවේණි දාසයා .මෙය රාජාණ්ඩු ක්‍රමයේ ලක්ෂණයක් මිස ප්‍රජාතාන්ත්‍ර වාදය සතු ලක්ෂණයක් නොවීය .එසේ නම් ඔබ මම අප සැම අත්දකින අපේ රටේ ආණ්ඩුක්‍රමය සහ චන්ද ක්‍රමය ගැන අපි ප්‍රශ්න කල යුතුය.මන්ද අපියි උන් පත්කළේ .උන් නියෝජනය කරනුයේ ඔබෙත් මගෙයි සිතුම් පැතුම් වන බැවිනි .ලජනතාව විසින් තමන්ගේ අභිවුර්ධිය සන්දහා තමා වෙනුවෙන් තෝරා පත් කරන ලද තැනැත්තා දේශ පාලකයායල .මන්ද ඔබටත් මටත් පාර්ලිමේන්තුව නියෝජනය කරනු බැරි බැවින් අපි වෙනුවෙන් ආපි ඔහුව තෝරා පත් කර හරි .

උන්ට බැන්නටත් පලක් නැතේ අද
මන්ද අපියි උන් පත්කෙරුවේ
කුමබල මාලූයි කලා තියෙන්නේ
කටු හිරවෙලා දැන් මර යුද්දේ

මුවා වී කුඩු ගෙන්වයි , එතනෝල් ගෙන්වයි ,බාබුල් ගෙන්වයි .ගෙන්වන ගමන් උන් ම වේදිකා වල කෑ ගසා කියයි මේ හැදෙම රටේ අනාගත් පරපුර උදෙසාය කියා . එවිට යලිත් ඇමති තුමාට ජයවේ කියනවා හැර වෙන කල හැක්කක් නොමැත .නමුත් මොහොතක් සිතා බැලූවහොත් මොවුන් ගෙන්වන මේ මත කුඩු වල ගැනුම් කරුවන් කරුන්ද කියා ,සම හරන්විට ඔබ නොදන්නා වා උවත් ඔබේම පුතා හෝ ස්වාමියා හෝ සොහොයුරා හෝ ක ගේ හෝ දරුවෙකු විය හැකිය .

සුරාව ගෙන්වමු මත්කුඩු ගෙන්වමු
ජනතාවට ආදරේ නිසා
සියරට දේ සිරිසැප දේ කියුවලූ
ගංජා වවමු අපි එකතු වෙලා

අද පාර්ලිමේන්තුව නියෝජනය කරන උන්ගෙන් 50%ක ටත් වැඩි පිරිසක් සැපිරිය යුතු අද්‍යාපන සුදුසුකම්ද සපුරා නැතිය .එවන් පිරසක් රට පාලනය කරන රටක ජනතාවට ඉතින් කිනම් සරණක් ද අර අබ සරණම ඇරෙන්න.අද ඇමති කමක් දැරීමට සැපිරිය යුත්තේ අද්‍යාපන සුදුසුකම් නොව , මැරබලය ,දූෂණය ,භිෂණය ,වංචාව ,සහ බොරුව ක්‍රියාවේ යෙදවිය හැකිනම් එයම රාජ්‍ය

දඩමස් හැර වෙන යමක් නොමැත .ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකු කාන්තාවන් සියයක් සමග යහන ගතව එය සැමරීමට පැවැත්වූ බෙ-ා්ජන සංග්‍රහයක තොරතුරු මෑතකදී මාද්‍ය මගින් ප්‍රසිද්ද කරන ලදී .එසේම අකුරැස්සේ සභාපතිගේ දුෂණ සිද්දිය ලොවම කම්පා කරවිය .එම සිද්දියේදී අපේ ශ්ජේඉදදන වාසි දේශ මාමකයින් එය සිංහලයින් සුද්දට එරෙහිව ඉගැන්වූ පාඩමක් යයි කීමට පහත් මානසික තත්වයකට පත්විය .අද කැලණියේ තත්වය කෙබදුද යන්න කවුරුත් දනී .ප්‍රාදේශීය සභාවල බොහෝ වැඩ කටයිතු කෙ-

ගැමුණු කුමරු කුඩු විකුණනවා අද
සිල්වා කෙනෙකුට දාව අනේ

කෙතරම් මැරකම් ,කෙතරම් බිහිෂණය වැපුරුවත් ,කෙතරම් උන් අපේ ඔළුගෙඩි පැළුවත් උන් හැමදාමත් ගරු කටයුතු ඇමති හෝ මන්ත්‍රිම වෙයි .අනෙ අපේ ජනතාව මේ වචනයේ අර්ථය කවදා තේරුම් ගනීද .මා දන්නා තරමින් නොමිලේ ජනතා සේවයක් කරන කිසිදු පුද්ගලයෙකු වර්ථමාන දේශපාලනය තුල නොමැත .උන් සැමදෙනාම ජනතා බදු මුදලින් වැටුප් ලබා ගනී .ඊට අමතරව ජනතා බදු මුදල් සොරා කති . ගරු යන විශේෂණය යොදනුයේ යමෙක් ජනතා සුබ සිද්ධිය සඳහා යමක් නොමිලේම කරයි නම් පමණි .එසේ හෙයින් දේශ පාලූවන්ට ගරු යන විශේෂණය භාවිතා කල නොහැකිය .ගරු දේශ පාලකයින් විසුයේ බොහෝ කලකට ඉහතය .උන් දේශ පාලනයට විත් උන් සතු චංචල හා නිශ්චල දේපළ ජනතා සුබසිද්දිය උදෙසා නැති කරගත්තා හැර උන් දේශපාලනයෙන් කීර්තිය හැර වෙනත් ලෞකික ලාබයක් අපේක්ෂා නොකරන ලදී .ඔවුන් වචනයේ පරිසමාප්ත අරුතින්ම ගරු මැති ඇමති වැරුම විය .ජනතා බදු මුදලින් ගොඩ නගන ආයතන ජනසතු කරනවා කියමින් තවත් වටයකින් ජනතාව මුලා කරන වර්ථමාන දේශපාලූවන් මේ ජනසතු යන වදනද වය්ශ්‍යා වුර්තියේ යොදවමින් භාවිතා කරන්නේ හරියට උන්ගේ පුද්ගලික මුදලක් යොදවා කල ක්‍රියාවක් යයි හැගීමක් ජනතාව තුල ඇති කරලීමටය .ජනතා බදු මුදලින් කල හෙයින් උන් කිවත් නොකීවත් ඒවා ජනතාව සතුමය .

අපෙන්ම අරගෙන අපිටම දීලා
ජන සතු කරනවා මෙන්න බොලේ
ජන සතු ගරු කටයුතු වැනි දේවල
තේරුම තව නෑ මුන් දන්නේ

කවදා මේ සාපය ඉවර වේවිද .එකෙක් අපේ මැති තුමා ට ජය වේවා කියන විට තව 100 එකට එකතුව අපේ මැතිතුමා ට ජය වේවා කීවත් කොයි මැති තුමද්ද ඔබලාගේ දරුවන්ට ජයවේවා ඔබට ජයවේවා කියල කියුවේ . සැමදාම උන් ඔබලව සූරා කාව හැරෙන්න උන් ඔබලට දුන්න දෙයක් නොමැත .උන් කේක් කාල උබලටත් පාන් නැත්තම් කේක් කාපන් කියුවා හැරෙන්න එක පාන් වාටියක් වත් උබලට දුන්නේ නැත .උන් අපිව සූර කෑවා හැරෙන්න උබල කෑවද බීවද කියලා වගක් නැත. නමුත් මතක තියා ගනිල්ලා සීසොවේ බර දරන්නේ උබල උඩ ඉන්නේ උන් ,උන්ව බිම තියන්න පුළුවනුත් උබලටයි .චන්දය දේශ පාලකයිනට මිස දේශ පාළුවන් වෙනුවෙන් පාවිච්චිය දැන්නවත් නවතවු .කැපුවත් කොළ,කැපුවත් නිල,කැපුවත් රතු වෙනුවට රට ගැන හිතල චන්දය පාවිච්චි කරවූ . වේදනා නාශක වෙනුවට තුවාලය සුව කරන පිළියම් සොයපල්ලා.

මෙය ,හුදෙක් වර්ථමාන චන්ද ක්‍රමය පිලිබඳ චන්ද පෝස්ටරයක් පමණි අලවා ගැනීම ඔබ සතුය.

# චන්දය දේශ පාලකයිනට මිස දේශ පාළුවන් වෙනුවෙන් පාවිච්චිය දැන්නවත් නවතවු .




උන් උඹලට හැම දාම දුන්නේ ඉඳුල් මිස උබලගේ ශ්‍රමය ට බලයට හිමි නිසි තැන නිසි ලෙස නො-වෙයි.උන්ගේ ඔක්කොම සටන් පාට බලේ ලැබෙන කල්ම පමණි .නමුත් උන් කතාවට හරි දක්ෂයෝ .උන්ගේ බතල කටින් මිස අතින් නොවන බව මතක තියා ගනිල්ලා .උන්ගේ පෝෂණ මල්ල උබලගේ දරුවනට නොව උන්ගේ උන්ටය .බලය ගන්න කල් විතරයි කොය් කොය් එකාගේත් කරුණාව .පස්සේ උන්න්ගේ කරුණාව ඉබේම හාලියාවට යනවා .කරුමය අරුමයක් කර නොගනිල්ල,උන් උබලගේ දෙපතුලට එන්නේ චන්දෙ කාලෙට විතරක් බව මතක තියල්ල...උන් පෙරට මිසක් රට පෙරට ගිය බවක් උබලට පේනවද. උබල දන්නෙවත් නැතුව ණය කාරයෝ වෙලා
.

ඔන්න ආශ්චර්ය .දරුවෝ කීදෙනෙකුට තාත්තලා අහිමි වෙලා ඇත්තද මේ කාල කන්නි චන්දක්‍රමය නිසා .බිරින්දෑවරු කීදෙනෙක් වැන්දඹු වෙලා ඇද්ද මේ කාල කන්න චන්ද ක්‍රමය නිශා ,මේ ජීවිත් විනාස වෙන්නේ යුද්දේ නිසා නොවෙයි.කවුද මේවට විරුද්දව කතා කරන්නේ .අපේ හාමුදුරුවනේ මේ ජීවිත ජීවිත නෙවෙය් ද.බැරිද පපුවට ගහගෙන මේ ජීවිත් වල වග කීම ගන්න .රොකට් අරින්නෙත් රට දුවන්නෙත් උබලගේ සල්ලි වලින් බව මතක තියා ගනිල්ලා, පස්සේ උබලගේ සාක්කුවටත් රොකට්ම තමයි .

දැන් පළාත් සභා චන්දෙ ඉවරයි ,ඔන්න හෙට අන-ද්දා මහා මැතිවරණයකට අර අන්දිනවලූ .ඒ කියන්නේ දැන් පොඩිඋන් බොරු කියල ඉවරයි ලොකු උන් උන්ගේ වරේ පටන් ගන්නවා කියන එකයි . ඔන්න පෙර නිමිති දැන්මම පහල වෙන්න පටන් අරගෙන .විදුලි මිල 25% අඩු කෙරේ ,පාලක පක්ෂයෙන් .විපක්ෂයේ සියල දෙනා එකම වේදිකාවක .පොදු අපේක්ෂකයා ජනාදි පති පුටුවට ,ජනාදි පති කම අහෝසි කිරීමට . තව හෙට අන-ද්දා වෙනකොට පෝෂණ මලූ ගැබිණි මවුවරුන්ට (ඉපදෙන්න ඉන්න උන්ව රවට්ටන්න )ගමේ ක්‍රීඩා සමිති වලට ක්‍රිකෙට් බැට් ,බෝල (විරුද්ධ පා-ක්සිකයින්ගේ ඔලූ පැලීමට ) .නිදහසේ චන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රජා අයිතියවත් නැති රටක ජනතාවට නොමිලේ ප්‍රජාශාලා .මන්දපෝෂණයෙන් තවමත් දරුවන් මිය යන රටක තරුණයන්ට කායවර්ධන උපකරණ .අදින්න ඇඳිවත නැති උන්ට විදුලි ඉස්තිරික්ක .නය ගෙවාගන්න බැරුව ඉන්න ගොවීන්ට පොහොර සහණාධාර , බොරලූ වලට උඩින් තාර.මේ කීපයක්ම පමණි .

තණකොළ නුබුදිති සිංහ පැටව්
දැන් ඉඳුල් කන්න වත් සල්ලි නැතේ
පිට රටින් එනතුරු මුහුදට දත නිය
වනවා හැර වෙන මගක් නැතේ

මැතිවරණ සමයේ මවන අශ්චාරය මැතිවරණ උණුසුම නිමවෙනවා සමගම හැලියාවට යයි .එතැන් සිට ඔබ පත් කල ,ඔබේ චන්දෙන් පත් උන උන් උන් ගේ මල්ලම තර කර ගැනීමටම වෙහෙසේ . දැන් උන්ට රට ගැනවත් චන්දෙ දුන් ජනතාව ගැනවත් වගක් නැත .උන් උන්ගේ බලතල වලට

පාලනයට සුදුසුකමක් වෙයි .අද පාර්ලිමෙන්තිව නියෝජනය කරන කීප දෙනෙකුටම එරෙහිව ස්තිදුෂණ චෝදනා ඇත ,තව පිරිසකට එරෙහිව මත්ද්‍රව්‍ය චෝදනා ඇත ,තවත් පිරිසකට එරෙහිව දුෂණ හෝ වංචා චෝදනා ඇත .අමතක නොකළ යුතු දෙයනම් උන් සියලූ දෙනාම පත් කලේ ඔබෙත් මගෙත් චන්දයෙන් මිස පිට සක් වලින් පැමිණිය උන් නොවන බවය .අපි තවමත් කැපුවත් කොළ ,කැපුවත් නිල් ,කැපුවත් රතු සංකල්පයෙන් මිදී නොමැත .උන් ඔබලාට මිදෙන්න නොදෙන බවද සහතිකය .අද විපක්ෂයක් කියා දෙයක් නොමැත .විපක්ෂයට රටක් තියෙන වග සිහියට එන්නේ චන්දෙ කාලෙට පමණි .උන් දෙන දේ කලා වෙනදේ බලාගෙන ඉන්න තාලෙට කල් ගෙවයි .අද විප-ක්ෂයට රජය කරන සම දෙයම වැරදිය. උන් කිසම ජනතා හිතවාදී යෝජනාවකට සහය නොදෙයි .අලූත්ම විලාසිතාවට අනුව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ගෙනෙන කිසිදු යෝජනාවකට ඔවුන් සහය නොදෙයි .ලචන්දය විමසන අවස්ථාවේ විපක්ෂය සබහ ගැබේ නොසිටින ලදී ල.ආණ්ඩු පක්ෂයද මිට දෙවැනි නොමැත උන් විපක්ෂයේ කඩා පනින හමුදාවට එලව එලවා පහරදෙ .විප-ක්ෂයට එරෙහිව සෙල්ලන් පිස්තොලද පෙන්වයි .

තොට ළඟ හන්දියේ තොට ළඟ උනාට
මට ළඟ නැහැ කියුවලූ අයිසේ
මේ වගේ උන් රට කරනවා හිටගෙන
මහ ජතාවගේ පින් මහිමේ

සමහර ප්‍රදේශ තාමත් මුදා නොගත් ප්‍රදේශ වැනිය .ඒවායේ පාලනය පළාතේ දේශපාලන හෙන්චය්යලට අනුව මිස රටේ ස්ථාපිත නීතියට අනුව නොවෙයි . උන්ගේ හක්කේ බුදුරැස් බොක්කේ

රෙනුයේ ටෙන්ඩර් පටිපාටියෙන් එපිට උන් උන්ගේ හිතවත් කම් උඩය .අප රට මේ පළාත්සභා ක්‍රමය කොච්චර දුරට රටට ගැලපේද යන්න නැවත නැවතත් සිතාබැලිය යුතුය .මේ ක්‍රමය තුලින් සිදුවූ එකම වෙනස නම් කුඩු මුදලාලිලාට ප්‍රාඩෝ සමග දේශපාලන ආවරණයක් ලැබීම පමණි .එදා කුඩු මුදලාලිලා අද ආචාරිලාය .

බොලේ කැලණියේ විභිෂනත් අද
නින්දට වැටිලද කොහිද බොලේ

